# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 13,564 — 1963 මාර්තු 15 වැනි සිකුරාද — 1963.3.15**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... | 51බී. |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය ... ... | 361 | මිළ පාලන දැන්වීම් ... ... | |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය ... | 362 | ශ්‍රී ලංකා මහා බැංකුවේ දැන්වීම් ... | |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය ... | 362 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... | ... |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | 363 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... | ... |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | ... |
| | | "සුරාබද්ද ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... | ... — |


[සැ.යු.—"1962 ආයුර්වේද (මණ්ඩලවලට තෝරා පත් කිරීම්) නියෝග" මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (I) වෙනි ඡේදයට අතිරේකයක් වශයෙන් පළවේ.]

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

**1963 අංක 94**

අංකය : ඩී. 31/රෙක් ව/1.

### යුද්ධ හමුදාව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් ඇති දිනයන්හි සිට මේජර් තනතුරට උසස් කරන ලදී:—

කපිතාන් (තාවකාලික මේජර්) දිගනාන් තිරිගේ එඩ්මන්ඩ් ද සිල්වා, ල. යු. සේ. බ.—1962 අගෝස්තු මස 1 වැනිදා.

කපිතාන් (තාවකාලික මේජර්) සිසිල් තියඩෝරා කල්දේරා, ල. ස. බ.—1962 අගෝස්තු මස 1 වැනිදා.

කපිතාන් (තාවකාලික මේජර්) දොඩම්පෙගමගේ බූපානන් ද පෙරේරා, ල. සි. රෙ.—1962 අගෝස්තු මස 1 වැනිදා.

කපිතාන් (තාවකාලික මේජර්) මුණසිංහ ආරච්චිගේ විජේසේන වීරසිංහ, ල. වි. යා. ඉ.—1962 අගෝස්තු මස 1 වැනිදා.

කපිතාන් (තාවකාලික මේජර්) ගාමිණී පියෙන්සි ජයසිංහ, ල. යු. යු. බ.—1962 අගෝස්තු මස 1 වැනිදා.

කපිතාන් (තාවකාලික මේජර්) ක්ලින්ටන් චාර්ල්ස් ලැබ්‍රෝයි, ල. පා. හ.—1962 සැප්තැම්බර් මස 29 වැනිදා.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කෘ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

963 මාර්තු 5 වෙනිදා,
කොළඹ දීය.

-551

**1963 අංක 95**

අංකය : ඩී. 17/රෙක් ව.

### යුද්ධ හමුදාව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද තනතුර අත්හැරීමක්

හමුදා අණපණතේ (357 පරිච්ඡේදය) 13 (1) වගන්තිය අනුව, 1963 ජනවාරි මස 10 වැනි දින සිට පහත සඳහන් නිලධාරියා ආධුනික යන් බඳවන නිලධාරි තනතුරු අත්හරින ලදී:—

අබ්දුල් මජීඩ් මොහමඩ් පරීඩ්.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කෘ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1963 මාර්තු 4 වෙනිදා,
කොළඹ දීය.

3-572

---

**1963 අංක 96**

අංකය : ඩී.22/රෙක් ව/45.

### රාජකීය ලංකා නාවික හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

1963 මාර්තු මස 15 වැනි දින සිට, රාජකීය ලංකා නාවික හමුදාවේ නිත්‍ය හමුදාවෙන් කපිතාන් අයි. පී. මරේ විශ්‍රාම ගනී.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කෘ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1963 මාර්තු 5 වෙනිදා,
කොළඹ දීය.

3-573


61—ඩී 49970—5,076 (63/3)

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

**1963 අංක 97**

අංකය : ඒ. 133/62.

1963 පෙබරවාරි මස 15 වැනි දින සිට බී. පෙල්වත්ත මහතා ලංකා සිවිල් සේවයේ III වැනි පෙළේ සිට II වැනි පෙළට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් උසස් කර ඇත.

එන්. පී. විජයරත්න,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1963 මාර්තු මස 11 වැනි දින,
ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.
තැ. පෙ. 500,
කොළඹ 1.

3-769

---

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

**1963 අංක 98**

ධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත්කිරීම් ත්තේ ය :—

අංකය : ජේජ්. 33/48.

මලරත්න මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක ශයෙන් 1963 අප්‍රේල් මස 3 වැනි දින සිට කෑගල්ලේ දිස්ත්‍රික් උසාවියේ අංක 8036. ඒ/එල් දරණ නඩුව අසා අවසාන කිරීම සඳහා සහ තීන්දුව දීම සඳහා කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑම්. 2/56 (III).

ජේ. ජී. එල්. ස්වාරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, වී. එම්. කුමාරස්වාමි මහතා 1963 මාර්තු මස 5 වැනි දින සිට 16 වැනි දින දක්වා අවිස්සාවේල්ලේ වැඩබලන මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ අවිස්සාවේල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේජ්. 23/48.

සී. තනබාලසිංහම් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් යාපනේ දිස්ත්‍රික් උසාවියේ අංක පී/11845 සහ එල්. 1146 දරණ නඩු අසා අවසාන කිරීම සඳහා සහ තීන්දු දීම සඳහා යාපනේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : සීජේපී/එස්. 21/58.

ජේ. ජී. එල්. ස්වාරිස් මහතා 1959 ජුනි මස 27 වැනි දින සිට ලංකා ද්වීපයේ අධිකරණ සේවයේ නිලධාරියෙකු වශයෙන් ස්ථිර කරන ලදී.

අංකය : ජේජ්. 13/48.

එස්. අමරසිංහ මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1963 අප්‍රේල් මස 2 වැනි දින සිට කොළඹ මහේස්ත්‍රාත් උසාවියේ අංක 6639/බී දරණ නඩුව අසා අවසාන කිරීමට සහ තීන්දුව දීම සඳහා අතිරේක මහේස්ත්‍රාත් ධුරයට සහ කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේජ්. 5/48.

එස්. ශේජකනාදන් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1963 මාර්තු මස 21 වැනි දින සිට බදුල්ලේ මහේස්ත්‍රාත් උසාවියේ අංක 35142, 36768, 38035, 37857, 37082 සහ 33372 දරණ නඩු අසා අවසාන කිරීම සහ තීන්දු දීම සඳහා බදුල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ බදුල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 41. ඒ/60.

එස්. ජේ. එම්. ජී. එස්. මුදන්නායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, සී. ඒ. එල්. කොරෙයා මහතා 1963 මාර්තු මස 8 වැනි දින සිට 11 වැනි දින දක්වා හලාවත අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, හලාවත අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 37. ඒ/55.

පී. මාරපන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, සී. එච්. උඳලාගම මහතා 1963 මාර්තු මස 9 වැනි දින සිට 11 වැනි දින දක්වා කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 16. ඒ/59.

ඩී. ඊ. ධර්මසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, සී. එල්. ද සිල්වා මහතා 1963 මාර්තු මස 3 වැනි දින බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 7. බී/56 (II) ඒ.

එල්. එච්. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඒෆ්. වී. එච්. ලා බ්‍රෝයි මහතා 1963 මාර්තු මස 21 වැනි සහ 22 වැනි දිනයන්හි නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑළියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, නුවරඑළියේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට සහ බදුල්ලේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 7. බී/56 (II).

එල්. එච්. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එම්. එලියතම්බි මහතා 1963 මාර්තු මස 16 වැනි දින නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑළියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, නුවරඑළියේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට සහ බදුල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 1. සී/53.

එම්. එම්. අබ්දුල් කාදර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, වී. කනගසබෙයි මහතා 1963 මාර්තු මස 16 වැනි දින සිට 19 වැනි දින දක්වා පේදුරු තුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, පේදුරු තුඩුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 40. ඒ/60.

සී. එල්. ටී. මූනමලේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජේ. අමරසිංහ මහතා 1963 මාර්තු මස 6 වැනි දින සහ 16 වැනි දින සිට 18 වැනි දින දක්වා හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 1/ඒ/48.

පී. එස්. ඩබ්ලිව්. අබේවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එන්. කුමාරස්වාමි මහතා 1963 මාර්තු මස 11 වැනි දින මහනුවර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, මහනුවර අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, දුම්බර අතිරේක මහේස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ මාතලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 13. ඒ/59.

පී. ඩී. ජී. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ මහතා 1963 මාර්තු මස 4 වැනි දින මාතර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 67. ඒ/58.

ඩබ්ලිව්. ඩී. තාමෝදරම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු එස්. එලියතම්බි මහතා 1963 මාර්තු මස 18 වැනි දින සිට මල්ලාකම්හි ක්‍රියා කරන පිඩිස යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ යාපනේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 66. ඒ/54 (III).

සී. තනබාලසිංහම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු. ජේ. ජේ. ඩේවිඩ් මහතා 1963 අප්‍රේල් මස 1 වැනි දින සිට 4 වැනි දින දක්වා මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, මඩකලපුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 23. ඒ/58.

ඒ. ඩබ්ලිව්. ගුණරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ටී. ජේ. සී. පීරිස් මහතා 1963 මාර්තු මස 28 වැනි සහ 29 වැනි දිනයන්හි පානදුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ පානදුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : පී.එල්/එම්. 5/54.

ටී. එම්. මත්‍යාපෙරනාම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ආර්. වී. විල්වරාජා මහතා 1963 මාර්තු මස 16 වැනි දින සිට 22 වැනි දින දක්වා වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඑල්/එම්. 5/54.

ටී. එම්. මත්‍යාපෙරනාම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ආර්. වී. විල්වරාජා මහතා 1963 මාර්තු මස 7 වැනි දින, 14 වැනි දින සිට 16 වැනි දින දක්වා සහ 18 වැනි දින සිට 21 වැනි දින දක්වා වවුනියා සහ මන්නාරම දිස්ත්‍රික්කවල දකුණු වවුනියාවේ ගම්බද උසාවි සභාපති වශයෙන් සහ මාන්ටෙයි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 5/53.

ඒ. බී. අළුවිහාරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු ඩී. සී. විජේසිංහ මහතා 1963 මාර්තු මස 7 වැනි දින අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරලේ සහ පාත බුලත්ගම සහ ඇතුළුගම සහ පනාවල් කෝරලයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් හා බෙලිගල් සහ කුරුවිට කෝරලයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ටී. 4/59.

ඩී. බී. එල්ලේපොල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ටී. ශ්‍රී. පත්මනාදන් මහතා 1963 මාර්තු මස 21 වැනි සහ 22 වැනි දිනයන්හි බදුල්ල දිස්ත්‍රික්කයේ වෙල්ලස්ස-බින්තැන්න සහ බුත්තල ගම්බද උසාවි සභාපති වශයෙන් සහ යටිකිඳ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ටී. 4/59.

ඩී. බී. එල්ලේපොල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, වී. පී. අබේවික්‍රම මහතා 1963 මාර්තු මස 5 වැනි දින සිට 7 වැනි දින දක්වා බදුල්ල දිස්ත්‍රික්කයේ වෙල්ලස්ස-බින්තැන්න සහ බුත්තල ගම්බද උසාවි සභාපති වශයෙන් සහ යටිකිඳ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/අයි. 4/52.

ජේ. ටී. ඉලන්ගන්තිලක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, පී. එස්. මහලේකමේ මහතා 1963 මාර්තු මස 8 වැනි දින මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ හරිස්පත්තුවේ, පාත හේවාහැට සහ උඩ හේවාහැට ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 10/62.

එච්. අමීන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, සී. ටී. කාසිනාදර් මහතා 1963 මාර්තු මස 6 වැනි දින මඩකලපු දිස්ත්‍රික්කයේ ඉරාවූල්, පොරාටිව් සහ දකුණු මාන්මුනෙයි පත්තුවේ ගම්බද උසාවි සභාපති වශයෙන් සහ උතුරු මාන්මුනෙයි පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ජී. 2/50.

ඩබ්ලිව්. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, සී. එල්. ඩබ්ලිව්. ගුණසේකර මහතා 1963 මාර්තු මස 28 වැනි දින රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් සහ කොලොන්නා කෝරලයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

ඇන්. ඒ. ද එස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1963 මාර්තු මස 7 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංක 573,
කොළඹ 12.

3-677

# වෙනත් පත්කිරීම් ආදිය

1963 අංක 99

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ (20 වෙනි පරිච්ඡේදයේ) 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

මගේ අංක : ඒඅයි. 11/1/51.

1963.2.28 වෙනි දින සිට, මන්නාරම් දිස්ත්‍රික්කයේ නානත්තම් බටහිර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් එස්. එක්ස්. මෝතම් මහතා ද,

මගේ අංකය : ඒ.අයි. 9/3/59.

1963.2.28 වෙනි දින සිට, යාපනය දිස්ත්‍රික්කයේ නයිනාතිව් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් වයිතිලිංගම් මාරිමුත්තු මහතා ද,

මගේ අංකය : ඒ.අයි. 10/1/62.

1963.2.28 වෙනි දින සිට, වවුනියා දිස්ත්‍රික්කයේ මුහුදුබඩ පත්තුවේ, කරිකඩුමුල දකුණු කොටසේ හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් ඇප්. ඒ. ප්‍රනාන්දු මහතා ද,

මගේ අංකය : ඒ.අයි. 10/3/62.

1963.2.28 වෙනි දින සිට, වවුනියාව දිස්ත්‍රික්කයේ, වවුනියා දකුණු දෙමළ කොටසේ දකුණු කිලක්කමුල කොටස සඳහා හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් ආර්. වී. විල්වරාජා මහතා ද,

මගේ අංකය : ඒ.අයි. 11/6/51ඒ.

1963.2.28 වෙනි දින සිට මන්නාරම් දිස්ත්‍රික්කයේ මෙට්කුමුලයි කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් එම්. සන්මුගම් මහතා ද,

මගේ අංකය : ඒ.අයි. 11/6/51බී.

1963.2.28 වෙනි දින සිට, මන්නාරම් දිස්ත්‍රික්කයේ පනක්කාමම් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් කේ. පරමනාදන් මහතා ද,

මගේ අංකය : අයි.එන්.කිව්එල්. 3/1/63.

1963.3.1 වෙනි දින සිට ඩී. බී. වීරසේකර මහතා නැවත වැඩ භාර ගන්නාතුරු මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට ඩී. එම්. ගුණරත්න මහතා ද,

මගේ අංකය : අයිඑන්කිව්එල්. 4/1/63.

1963.2.15 වෙනි දින සිට බී. ෂාහුල්හමීඩ් මහතා නැවත වැඩ භාර ගන්නාතුරු මාතලේ දිස්ත්‍රික්කයේ පල්ලේසියපත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට ටී. විමලසිංහ මහතා ද,

මගේ අංකය : අයිඑන්කිව්එල්. 8/1/63.

1963 පෙබරවාරි මස 22 වෙනි දින සිට ටී. වීරසේකර මහතා නැවත වැඩ භාරගන්නාතුරු හම්බන්තොට දිස්ත්‍රික්කයේ කිරම, කටුවන සහ කිරම පරණගම්පළාතේ සහ වලස්මුල්ල පළාතේහි හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට ඩබ්ලිව්. ගුණරත්න මහතා ද,

මගේ අංකය : අයිඑන්කිව්එල්. 21/4/63

1963 පෙබරවාරි මස් 28 වෙනි දින සිට සිරිල් ජයසේකර මහතා නැවත වැඩ භාරගන්නාතුරු අම්පාරේ දිස්ත්‍රික්කයේ මධ්‍යම කඳවුර ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට යූ. එල්. සුලාසිමන් ලෙබ්බේ මහතා ද,

පත්කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1963 මාර්තු මස 11 වෙනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේ දීය.

3-765

---

1963 අංක 100

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්——

1. සී. පී. අමරසිංහ මහතා, කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

2. එච්. කේ. සී. ගුණරත්න මහතා, රත්නපුර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,

3. ඇම්. කේ. පීටර් ද සිල්වා මහතා මාතර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

4. ඩබ්ලිව්. පී. දළුවත්ත මහතා, කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

5. ජී. එස්. රණසිංහ මහතා, ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද

පත්කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1963 මාර්තු මස 9 වෙනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේ දීය.
3-767

---

1963 අංක 101

## දැන්වීමයි

කිත්සිරි පෙරේරා ගුණරත්න මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

වී. ඇල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1963 මාර්තු මස 6 වැනි දින,
කොළඹ දී ය.
3-586

---

# ආණ්ඩුවේ නිවේදන

පී. ඇන්. 1284/ජී.

ඇල්. ඩී.—බී. 97/41.

## විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා

1948 අංක 13 දරණ විශ්‍රාම වැටුප් (සංශෝධන) පනතින් සංශෝධිත 1934 පෙබරවාරි 5 වෙනි දින දරණ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවන්හි 51 වෙනි වගන්තිය යටතේ වූ නිවේදනය.

පී. බී. ජී. කලුගල්ල,
මුදල් ඇමති.

1963, පෙබරවාරි මස 28 දින.
කොළඹ.

### නිවේදනය

1. කලින් කල සංශෝධිත 1934 පෙබරවාරි 5 වෙනි දින දරණ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල ඇ. උපලේඛනයෙහි (21) වෙනි කරුණට ඉක්බිති ව ම පහත දක්වෙන අලුත් කරුණ යෙදීමෙන් එය වැඩි දුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"22 රෙජිස්ට්‍රාර් ලංකා කාර්මික විද්‍යාල දෙපාර්තමේන්තුව".

2. මේ නිවේදනයෙහි 1 වෙනි ඡේදයෙන් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවන්හි කරනු ලැබූ සංශෝධනය 1962 මැයි 1 වෙනි දින බලපැවැත්වූ ලෙස සැලකිය යුතු ය.

3-561

---

## සාගින්නෙන් මිදවීමේ ව්‍යාපාරය අනුස්මරණය සඳහා නිකුත් කෙරෙන විශේෂ මුද්දර

සාගින්නෙන් මිදවීමේ ව්‍යාපාරය අනුස්මරණය සඳහා 1963 මාර්තු 21 වැනි දින ශත පහේ සහ ශත විසි පහේ වර්ගවල විශේෂ මුද්දර නිකුත් කෙරෙන බව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ මුද්දර, 1963 දෙසැම්බර් මස 31 වැනි දිනය හෝ තොගය විකිණී අවසන් වන දිනය හෝ යන දෙදිනෙන් කලින් එන දිනය දක්වා විකිණීම පිණිස තබනු ලැබේ. දැනට භාවිතා කරන අනුරූපී වගර්වල මුද්දර විකිණීම මේ කාලය තුළ දී අත්හිටවනු ලැබේ.

2. එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙන් සපයන ලද විශේෂ ලාංඡනයක් (වැඩෙන තිරිඟු කරල් තුනක්) සහිත පොදු මෝස්තරයක් මේ මුද්දර දෙකේ තිබේ.

පී. බී. ජී. කළුගල්ල,
මුදල් ඇමති.

1963 මාර්තු මස 8 දින.

3-733

---

## ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු හා ඇප පත්‍ර ආඥා පනත

(420 වැනි අධිකාරය වන) ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු හා ඇප පත්‍ර ආඥා පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර මා වෙත පැවරී ඇති බලතල අනුව මුදල් ඇමති, ඉඩම්පිටිය රාල්ලාගේ පුංචි බණ්ඩා ගුණතිලක කලුගල්ල වන මම, 1962 අංක 30 දරන විසර්ජන පනතින් ණය මාර්ගයෙන් ගැනීමට බලය පවරන ලද රුපියල් පණස් කෝටියෙන් මෙහි පහත උපලේඛනයෙහි නියමිත මුදල, එම උපලේඛනයේ සඳහන් ක්‍රමය, නියමයන් හා කොන්දේසි අනුව, ලංකාව ඇතුළත ණයට ගැනීමට මේ ආඥාවෙන් නියම කරමි.

පී. බී. ජී. කලුගල්ල
මුදල් ඇමති.

1963 මාර්තු 12 වැනි දින.

### උප ලේඛනය

1. ණයට ගත්‍යුතු මුදල රුපියල් දෙකෝටි පනස් ලක්ෂයක් විය යුතුය. තවද එය සම මිලට නිකුත් කරන අවුරුදු 21/25 ණය මුදලක් වශයෙන් ලබා ගත යුතුය.

2. ණය මුදල ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු ඇතිකර නිකුත් කිරීමෙන් පමණක් ලබා ගත යුතුය.

3. ණය මුදල සඳහා ගෙවිය යුතු පොළිය වර්ෂයකට සියයට 4¼ක් විය යුතුය.

4. ණය මුදල සඳහා සෑම වර්ෂයකම අර්ධ වාර්ෂික පොළිය ගෙවිය යුතු දිනයන් මාර්තු දහසය වැනිද හා සැප්තැම්බර් දහසය වැනිද විය යුතුය.

5. ණය බේරීම සඳහා පිහිටුවන නිදන් අරමුදලට වර්ෂයකට සියයට 3 මුදලක් ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් අර්ධ වාර්ෂිකව ගෙවිය යුතුය. මේ ගෙවීම 1964 මාර්තු දහසය වැනිද ආරම්භ විය යුතුය.

6. ණය ලබා ගැනීම සඳහා නිකුත් කරන ලද ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු සඳහා මුදල් ආපසු ගෙවීමේ දිනය, 1988 මාර්තු දහසය වැනිද විය යුතුය.

එහෙත් 1984 මාර්තු පහළොස් වැනිදට පසු ඕනෑම දිනයක ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු සම මිලට ආපසු ගෙවීමේ කැමැත්ත ආණ්ඩුවට තිබිය යුතුය. මෙසේ මුදල් ආපසු ගෙවීමේ දිනය, මුදල් ඇමතිවරයා විසින් නියම කළ හැකි අතර, එම දිනයට හය මාසයකට නො අඩු කාලයකට පෙර ඒ දිනය ගැසට් පත්‍රයේ හා යටත් පිරිසෙයින් ලංකාවේ පැතිරෙන පුවත් පත් දෙකක දැන්වීම් මාර්ගයෙන් ප්‍රසිද්ධ කළ යුතුය.

### කාර්ය විස්තර පත්‍රිකාව

ව්‍යාපාර වස්තුන් සඳහා මුදල් භාර ගැනීමේ ලැයිස්තුව 1963 මාර්තු 23 වැනි දින විවෘත කොට
1963 අප්‍රියෙල් 23 වැනි දින වසා දමනු ලැබේ. මුළු ණය මුදල ඊට පළමුව ලබා ගතහොත්, එම දිනයෙහිම
මුදල් ලැයිස්තුව වසා දමනු ලැබේ

**ලබා ගන්නා ණය ප්‍රමාණය රුපියල් 2,50,00,000 කි**

**ලංකාණ්ඩුවේ සියයට 4¼ ණය මුදල, 1984–88, ''ඇ'' කාණ්ඩය**

**සම මිලට නිකුත් කොට සම මිළට ආපසු ගෙවනු ලැබේ**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකාණ්ඩුව වෙනුවෙන් රුපියල් 2,50,00,000 ක ණය මුදලක් ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. එයට ගෙවනු ලබන පොළී ප්‍රමාණය සියයට 4¼කි. ණය මුදල ආපසු ගෙවනු ලබන්නේ 1988 මාර්තු 16 වැනි දය. නමුත්, හය මාසයක් කලින් දැනුම් දීමෙන් 1984 මාර්තු 15 වැනිදට පසුව, ඕනෑම දිනයක ණය මුදල ආපසු ගෙවීමට ආණ්ඩුවට ඉඩ තිබේ. ණය ආපසු ගෙවන්නේ ද සම මිලටමය.

**ණය ලබා ගැනීමේ බලය.**—ණය මුදල ලබා ගන්නේ 1962 අංක 30 දරණ විසර්ජන පනතින් ලත් බලයෙන් හා ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු හා ඇප පත් ආඥා පනතේ (420 වැනි පරිච්ඡේදය) අඩංගු නීති යටතේය.

**අරමුණ.**—රජය විසින් මේ ණය මුදල ලබාගනුයේ 1962 අංක 30 දරණ විසර්ජන පනතේ 2(1) (බී) වගන්තිය යටතේ 1962–63 මුදල් වර්ෂයේ සේවාවන් සඳහා වැය කරණු පිණිසය.

**නිකුත් කරන පිළිවෙළ.**—ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු නිකුත් කිරීමෙන් ණය මුදල ලබා ගනු ලැබේ. (ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය අරමුදල් පිළිබඳ දෙපාර්තමේන්තුවෙන් ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු පිළිබඳව බලපවත්වන කොන්දේසි අඩංගු පත්‍රිකා ලබා ගත හැකිය.

**ණය කොටසක මිළ.**—ණය කොටසක මිල රුපියල් සියයට සියයකි. සම්පූර්ණ මුදල ඉල්ලුම් පත් ඉදිරිපත් කරන විට ගෙවිය යුතුය. අඩුම කොටස රුපියල් සියයකි.

**ඉල්ලුම් පත්.**—ඉල්ලුම් පත් 1963 මාර්තු 23 වැනිද සිට ණය මුදල් ලබා ගන්නා ලැයිස්තුව පියවනතුරු, රාජ්‍ය ණය රෙජිස්ට්‍රාර් තැන විසින් භාර ගනු ලැබේ. ණයට මුදල් දීමේ ඉල්ලීම් නියමිත ඉල්ලුම් පත්‍රිකා වල එවිය යුතු අතර, ඊට ගෙවිය යුතු මුළු මුදල ඒ සමඟ එවිය යුතුය. ලංකා මුදල් ඉතිරිකිරීමේ බැංකුවේ හා තැපැල් කන්තෝරු මුදල් ඉතිරිකිරීමේ බැංකුවේ මුදල් තැන්පත් කරන්නන්ට ඒ ආයතන සමග කටයුතු පිළියෙළ කොට ඒවා මාර්ගයෙන් ඉල්ලුම් පත් ඉදිරිපත් කළ හැකිය.

බැංකුවලට ද (මුදල් ඉතිරිකිරීමේ බැංකුව හා තැපැල් කන්තෝරු මුදල් ඉතිරිකිරීමේ බැංකුව ඇතුලු) පිළිගත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ට හා අවසර ලත් තැරැව්කරුවන්ටද, ඔවුන්ගේ මුද්‍රාව දරණ ඉල්ලුම් පත් වෙනුවෙන් භාර ගත් නාමික ණය මුදල අනුව සියයට $\frac{1}{16}$ක් කොමිස් වශයෙන් දෙනු ලැබේ. හුවමාරු ගාස්තු වශයෙන් නීතිඥවරුන්ට තමන්ගේ මුද්‍රාව දරණ ඉල්ලුම් පත්වල භාර ගත් ණය මුදල සම්බන්ධයෙන් ඒ ප්‍රමාණයේම කොමිස් ගෙවනු ලැබේ.

**ව්‍යාපාර වස්තු සඳහා ගෙවීම.**—''ලංකාණ්ඩුවේ ණය අරමුදල'' යනුවෙන් හරස් රේඛිත කොට මහ බැංකුව වෙත ගෙවීමට අණ කරන චෙක් පතකින් මුදල් ගෙවිය යුතුය.

**ව්‍යාපාර වස්තු කොටස් සහතික පත්‍ර.**—ඉල්ලුම් පත් ලැබීමෙන් හා පිළිගැනීමෙන් පසු ව්‍යාපාර වස්තු කොටස් සහතික නිකුත් කරනු ලැබේ.

**පොළිය.**—සෑම වර්ෂයකම අර්ධ වාර්ෂිකව මාර්තු 16 වැනිද හා සැප්තැම්බර් 16 වැනිද වසකට සියයට $4\frac{1}{2}$ බැගින් පොළී ගෙවනු ලැබේ. පළමුවෙන් පොළී ගෙවන්නේ 1963 සැප්තැම්බර් 16 වැනිදය. ඒ පොළිය ගෙවනු ලබන්නේ ඉල්ලුම් පත් පිළිගත් දින සිට 1963 සැප්තැම්බර් 15 වැනිද තෙක් ඒ දිනය ද ඇතුලත් වන කාල සීමාව සඳහාය.

**අයබදු ගැනීම.**—(i) මුද්දර ගාස්තු :—ණය නිකුත් කිරීම, පවරා දීම හා ආපසු ගෙවීමාදියේ දී පාවිච්චි කරන සෑම ලියවිල්ලක් ම මුද්දර ගාස්තුවලින් නිදහස් ය.

(ii) ආදයම් බදු :—ලංකාවේ පදිංචි ව්‍යාපාර වස්තු හිමියන්ට ආදයම් බදු අඩු නොකර පොළී ගෙවනු ලැබේ. නමුත්, ආදයම් බද්දට යටත්වන ලංකාවේ පදිංචි ව්‍යාපාර වස්තු හිමියන් ආදයම් බදු සඳහා තමාගේ ආදයම් පෙන්වීමේදී එම පොළිය ද අඩංගු කළ යුතුය. ලංකාවේ පදිංචි නොවූවන්ට පොළී ගෙවීමට පෙර ආදයම් බදු අඩු කර පොළී ගෙවනු ලැබේ. (දැනට ආදයම් බදු ප්‍රමාණය, ලංකාවේ පදිංචි නොවූ පුද්ගලයන්ගෙන් සියයට $33\frac{1}{3}$ක් ද, ධනය ඒකාබද්ධ වූ හින්දු පවුල්වලින් සියයට $39\frac{1}{3}$ක් ද, පිට රට ලියා පදිංචි කළ සමාගමවලින් සියයට $62\frac{1}{3}$ක් ද වෙයි). ලංකා ආදයම් බද්දෙන් නිදහස් අයට, අය කරනු ලැබූ ආදයම් බදු එම දෙපාර්තමේන්තුවෙන් ආපසු ලබා ගැනීමට අයිතිවාසිකම් තිබේ.

(iii) ධන බද්ද :—1959යේ අංක 14 දරණ පුද්ගලික බදු පනතේ 6 (1) (ජී) වගන්තිය යටතේ ලංකාණ්ඩුවේ ණය පත්හි යොදන මුදල පුද්ගලයෙකුගේ ධනය වශයෙන් සලකනු නො ලැබේ. එබැවින් ඒවා ධන බද්දෙන් නිදහස් ය.

(iv) බූදල් බද්ද :—ලංකාණ්ඩුව විසින් ලංකාව ඇතුළත නිකුත්කරනලද ව්‍යාපාර වස්තු බූදල් බදු ගෙවීම සඳහා ආණ්ඩුව විසින් භාර ගනු ලැබේ. සම්පූර්ණ මුදල ගෙවූ සම මිලට නිකුත් කොට සම මිලට ආපසු ගෙවන ව්‍යාපාර වස්තූන්ගේ නාමික මිලත්, එයින් රැස්වන පොළියත්, ඒ සමාන බූදල් බද්දක් ගෙවීමට යෙදිය හැක. සම්පූර්ණ මුදල නො ගෙවූ හෝ අඩු මිලට නිකුත් කළ හෝ සම මිලට නොව වෙනයම් මිලකට ආපසු ගෙවන හෝ ව්‍යාපාර වස්තූන් සඳහා රුපියල් සියයේ ව්‍යාපාර වස්තු කොටසකිනුත්, එයින් උපදින පොළියෙනුත් ගෙවිය හැකි බූදල් බදු ප්‍රමාණය වරින් වර ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවේ. නමුත් එවැනි රුපියල් සියයේ ව්‍යාපාර වස්තු කොටසකින් ගෙවිය හැකි බූදල් බදු ප්‍රමාණය, මුලින් ව්‍යාපාර වස්තුව නිකුත් කරන අවස්ථාවේ දී ගෙවූ මුදලත්, ව්‍යාපාර වස්තුව ආපසු ගෙවීමේ දී ගෙවෙන මුදලත් යන දෙක්හි අඩු මුදල යමක් වේ ද, එයට නො අඩු මුදලක් වේ. මුදලින් බූදල් බදු ගෙවීම වෙනුවට ව්‍යාපාර වස්තු මාර්ගයෙන් ගෙවීම කළ හැක්කේ එම ව්‍යාපාර වස්තූන් මුලින් නිකුත් කරන අවස්ථාවේ දී ම මියගිය තැනැත්තා විසින් මිලයට ගෙන තිබේ නම් හෝ මරණයට වසකට නො අඩු කාලයකට පෙර එම ව්‍යාපාර වස්තූන් මිලයට ගෙන තිබේ නම් හෝ පමණකි.

**සුරක්ෂිතතාවය.**—ණය මුදල් ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් ආරක්ෂාවී ඇත. ණය ගෙවීමේ අරමුදල්හි භාරකරුවන් වන මහ බැංකුවේ මුදල් මණ්ඩලය එහි පාලනය යටතේ ණය මුදල් බේරීම සඳහා වෙන් වූ නිදන් අරමුදලක් පිහිටුවනු ඇත. වර්ෂයකට සියේට 3නේ ප්‍රමාණය අනුව 1964 මාර්තු 16 වැනිද සිට නිදන් අරමුදලට අර්ධ වාර්ෂික ගෙවීම් පටන් ගනු ලැබේ.

**ආණ්ඩුවේ ණය මුදලේ ප්‍රමාණය.**—දැනට ලංකාණ්ඩුවේ දළ සදතන ණය ප්‍රමාණය රු. 1,94,30,41,345කි. ණය බේරීම සඳහා වෙන් වූ නිදන් අරමුදලෙහි ආසන්න වෙළෙඳ වටිනාකම රු. 33,81,79,087කි. එම නිසා ආණ්ඩුවේ ඉතිරි ශුද්ධ ණය මුදල රු. 1,60,48,62,258කි.

**ඉල්ලුම් පත්.**—ඉල්ලුම් පත් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවෙන්, වාණිජ බැංකුවලින්, කච්චේරිවලින්, තැපැල් කායාීලවලින් හෝ ජාතික මුදල් ඉතිරි කිරීමේ ව්‍යාපාරයේ කොමසාරිස්වරයාගේ කායාීලයෙන් ද ලබා ගතහැකිය.

ඕ. බී. ගුණවර්ධන,
රාජ්‍ය ණය රෙජිස්ට්‍රාර් තැන.

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 1149,
කොළඹ 1,
1963 මාර්තු 15 වැනි දින දීය.

---

ඇල්.ඩී.—බී. 87/47.

අංකය : ජේ 25/62.

## ගම්බද අධිකරණ ආඥපනත

(8 වෙනි අධිකාරය වන) ගම්බද අධිකරණ ආඥපනතෙහි 6 වෙනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ වරයා විසින් පනවනු ලැබූ ආඥව.

සැම්. පී. සී. ප්‍රනාන්දු,
අධිකරණ ඇමති.

1963 පෙබරවාරි මස 8 වෙනි දින,
කොළඹ දී ය.

### ආඥව

1. පාතදුම්බර හා උඩදුම්බර ගම්බද අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව සංගෘහිත වන්නා වූ ද ගම්බද අධිකරණ ආඥපනතෙහි 2 (1) වෙනි වගන්තිය යටතේ පනවනු ලැබූ ආඥාවේ උපලේඛනයෙහි 6 වෙනි අංකය වශයෙන් තිබෙන්නා වූ ද (ඒ ආඥපනතෙහි 2 (1) වෙනි වගන්තිය යටතේ පනවනු ලැබ, අංක 11, 856 හා 1959 සැප්තැම්බර් 18 වෙනි දින දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ආඥාවෙන් ආදේශ කරනු ලැබූ) අංක 10,449 හා 1952 සැප්තැම්බර් 19 වෙනි දින දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද්දා වූ ද ප්‍රදේශය උඩ දුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයෙහි අංක 244, 244අ, 245 සිට 249 දක්වා, 251, 252 (කන්ද පහළ කෝරළේ) දරන ගම්මුලාදැනි කොට්ඨාශ ඉන් බැහැර කිරීමෙන් මෙයින් අඩු කරනු ලැබේ.

2. වෙල්ලස්ස කොට්ඨාශයේ, බින්තැන්න කොට්ඨාශයේ බුත්තල කොට්ඨාශයේ සහ යටිකිඳ කොට්ඨාශයේ ගම්බද අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව සංගෘහිත වන්නා වූ ද ගම්බද අධිකරණ ආඥාපනතෙහි 2 (1) වෙනි වගන්තිය යටතේ වූ ආඥවේ උපලේඛනයෙහි 40 වෙනි අංකය වශයෙන් තිබෙන්නා වූ ද (ඒ ආඥාපනතේ 2 (1) වෙනි වගන්තිය යටතේ පනවනු ලැබ අංක 12,717 හා 1961 ඔක්තෝබර් 13 වෙනි දින දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ආඥවෙන් ආදේශ කරනු ලැබූ) අංක 10,449 හා 1952 සැප්තැම්බර් 19 වෙනි දින දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද්දා වූ ද ප්‍රදේශය උඩ දුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයෙහි අංක 244, 244අ, 245 සිට 249 දක්වා, 251, 252 (කන්ද පහළ කෝරළේ) දරන ගම්මුලාදැනි කොට්ඨාශ ඊට එකතු කිරීමෙන් මෙයින් විශාල කරනු ලැබේ.

3-724/1

---

ඇල්.ඩී.—බී. 111/46.

අංකය : ජේ. 25/62.

## ගම්බද අධිකරණ ආඥපනත

### ආඥාව

(8 වෙනි අධිකාරය වන) ගම්බද අධිකරණ ආඥාපනත යටතේ වෙල්ලස්ස-බින්තැන්නේ ද, බුත්තල කොට්ඨාශයන්හි හා බින්තැන්න පත්තුවේ ද, ගම්බද අධිකරණය පිහිටුවා ඇති ප්‍රදේශය බදුල්ලේ දිස්ත්‍රික් උසාවියෙහි හා මහනුවර දිස්ත්‍රික් උසාවියෙහි ද ප්‍රාදේශීය අධිකරණ බල සීමාවට ඇතුළත් වන හෙයින්, අධිකරණ ඇමති සැමුවෙල් පීටර් ක්‍රිස්ටෝපල් ප්‍රනාන්දු වන මම, ඒ ආඥාපනතේ 42 වෙනි වගන්තියේ අතුරු විධානයෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, ඒ ප්‍රදේශයෙහි ගම්බද අධිකරණය කෙරෙහි වූ ඇපැල් අධිකරණ බලය යම් දිස්ත්‍රික් උසාවියක විනිශ්චයකාරවරයාට හා එක් එක් අතිරේක විනිශ්චයකාරවරයාට ලැබී ඔහු විසින් එය පාවිච්චි කළ යුතු ද ඒ දිස්ත්‍රික් උසාවිය බදුල්ලේ දිස්ත්‍රික් උසාවිය විය යුතු ය යි නියම කරමි.

සැම්. පී. සී. ප්‍රනාන්දු,
අධිකරණ ඇමති.

1963 පෙබරවාරි මස 8 වෙනි දින,
කොළඹ දී ය.

3-724/2

## කෘෂිකර්ම මධ්‍ය මණ්ඩලය ප්‍රතිසංවිධානය කිරීම

1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කැරුණු ප්‍රකාශනයෙන් ශෝධිත කෘෂිකර්ම දෙපාර්තමේන්තු ආඥාපනතේ (304 පරිච්ඡේදය) 4 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් ව්‍යවස්ථාපිත කෘෂිකර්ම මධ්‍ය මණ්ඩලය, පහත නම් සඳහන් නියෝජිතයින් පත් කළ සාමාජිකයින් වශයෙන් කටයුතු කරන බව, 1962 ජූලි 27 වැනි දින අංක 13,230 හා 1962 දෙසැම්බර් 7 වැනි දින අංක 13,423 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළවූ නිවේදනයට වැඩිමනත් වශයෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

**පත් කළ සාමාජිකයෝ**

55. ආර්. නමසිවායම් මහතා
56. ඒ. එම්. ක්ලෙමන්ට් ඩයස් මහතා

හ. තෙන්නකෝන්,
ස්ථාවර ලේකම්,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශය.

1963 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ මහලේකම් කාර්යාලයේ
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශයේ දී ය.
3-498

---

එල්. ඩී.—බී. 207/41.

## පඩිපාලක සභා ආඥාපනත

**7 වන වගන්තිය යටතේ නිවේදනයයි**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 7 (1) වෙනි වගන්තියේ විධිවිධාන අනුව මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මීට යා කොට ඇති උපලේඛනයෙහි දක්වෙන පරිදි දුම්කොළ කර්මාන්තය පිළිබඳ ආඥාවක් පැනවීමට මා අදහස් කරන බව එකී ආඥාපනතේ 6 (1) වෙනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරමි.

යෝජිත මෙම ආඥාවට විරුද්ධව කීමට ඇති කරුණු 1963 අප්‍රියෙල් මස 6 වෙනි දින දහවල් 12 දක්වා ම විසින් භාරගනු ලැබේ.
එ බඳු සෑම විරෝධතාවයක් ම එසේ විරුද්ධවීමට හේතුවූ කරුණු ඇතුළත් ප්‍රකාශයක් ද සහිත ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුතුය.

ඇම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු හා ජනසතු සේවා අමාත්‍යවරයා.

1963 මාර්තු මස 5 වන දින,
කොළඹ දී ය.

### උපලේඛනය

(136 වන අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 2 කොටසේ විධිවිධාන මෙහි පහත සඳහන් කර්මාන්තයට අදාල විය යුතුය :—
දුම්කොළ කර්මාන්තය, එනම්—

(අ) අක්කරයකට වැඩි ප්‍රමාණයේ දුම්කොළ වැවිල්ලක් වගාකිරීම ;

(ආ) දුම්කොළ සකස් කිරීම ; සහ

(ඇ) සකස් කරන ලද දුම්කොළ අලෙවි කිරීම ; ඇතුළුව—

(1) ගස් හෙළීම, මුල් උදුරා දැමීම සහ බිම එළි කිරීම ;

(2) අස්වැද්දීම, පිළිස්සීම, කාණු කැපීම, බිම සම තලා කිරීම, වැටි දැමීම, ලකුණු කිරීම හා වගා කිරීම සඳහා ජල සම්පාදනය කිරීම, හා

(3) අතුරු මාර්ග, දුම්මඩු, මඩු කොටුවැටවල් සහ ඉණිවැටවල් සෑදීම, අළුත් වැඩියා කිරීම හා නඩත්තු කිරීම ;

(4) තවාන සකස් කිරීම ;

(5) තවාන් වලට රසායනික සහ/හෝ රසායනික නොවන පොහොර යෙදීම ;

(6) ඇට වැපිරීම ;

(7) තවාන් ආවරණය කිරීම ;

(8) තවාන් වලට වතුර දැමීම ;

(9) පැළෑටි ශක්තිමත් කිරීම ;

(10) තවාන්වල වල් නෙළීම ;

(11) පැළෑටි තුනී කිරීම සහ පැළ සිටුවීම ;

(12) වැවිලිකරුවන්ට පැළෑටි, පොහොර සහ වෙනත් ද්‍රව්‍ය සැපයීම හා සම්බන්ධ කටයුතු ;

(13) පැළෑටි, පොහොර වර්ග සහ වෙනත් ද්‍රව්‍ය වැවිලි බිම් වෙත ප්‍රවාහණය කිරීම ;

(14) පැළෑටි සිටුවීම සහ පැළෑටි ආවරණය කිරීම ;

(15) පැළෑටි වලට සහ පැළ වලට වතුර දැමීම ;

(16) පැළෑටි සහ පැළ වලට රසායනික සහ/හෝ රසායනික නොවන පොහොර යෙදීම ;

(17) අතුරු වගාවන් කිරීම සහ වල් නෙළීම ;

(18) පැළෑටිවල සහ පැළවල රෝගයන් සහ කෘමීන් මර්දනය කිරීම හා සම්බන්ධ වැඩ ;

(19) වැලි කොළ කැඩීම, මල් කැපීම සහ රිකිලි කැපීම ;

(20) අස්වැන්න එකතු කිරීම බැඳීම සහ පැටවීම ;

(21) සකස් කිරීම ;

(22) බැම සහ මිටි බැඳීම ;

(23) වර්ග කිරීම, බේල් කිරීම, ඇසිරීම, ලකුණු කිරීම, අට්ටි ගැසීම සහ ගබඩා කිරීම ;

(24) සකස් කරන ලද දුම්කොළ මිළ දී ගනු ලබන ස්ථානවලට ප්‍රවාහණය කිරීම ;

(25) සකස් කරන ලද දුම්කොළ මිළදී ගනු ලබන ස්ථානවල මිළදී ගැනීම, වර්ගකිරීම, පරීක්ෂා කිරීම, අට්ටි ගැසීම, ඇසිරීම, බේල් කිරීම, ලකුණු කිරීම සහ ගබඩා කිරීම හා සම්බන්ධ වැඩ ;

(26) සකස් කරන ලද දුම්කොළ මිළදී ගනු ලැබූ ස්ථාන වල සිට පිට කිරීම පිළිබඳ වැඩ ;

(27) කංකානමකගේ වැඩ ;

(28) මුරකරුවකුගේ වැඩ ; සහ

(29) වගාකිරීම, සකස් කිරීම සහ දුම්කොළ අලෙවි කිරීම හා සම්බන්ධ සියළු අනික් වැඩ කට යුතු ;

එහෙත් පහත දැක්වෙන සේවකයන් ගේ කාර්යයන් ඇතුළත් නො වන්නේ ය :—

(1) ලිපිකරුවෝ, ගබඩා භාරකරුවෝ, පරිපාලකවරු, ඕවර්සියර්වරු, උපදේශකවරු සහ කැෂියර්වරු ;

(2) වර්‍ෂ 1954 නොවැම්බර් මස 2 වන දින අංක 9,481 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවෙහි නියමිත මෝටර් රථ ගමනාගමනය පිළිබඳ කර්මාන්තයේ නියුක්ත කම්කරුවන් ;

(3) වර්ෂ 1944 ජනවාරි මස 7 වන දින අංක 9,224 දරන ගැසට් පත්‍රයේ පළවූ සහ අනතුරුව සංශෝධිත ආඥාවෙහි නියමිත ඉංජිනේරු කර්මාන්තයේ නියුක්ත කම්කරුවන් ; සහ

(4) වර්ෂ 1949 දෙසැම්බර් මස 16 වන දින අංක 10,054 දරන ගැසට් පත්‍රයේ පළ වූ සහ අනතුරුව සංශෝධිත ආඥාවෙහි නියමිත ගොඩනැගිලි කර්මාන්තයේ නියුක්ත කම්කරුවන්.

3-510

---

## 1957තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පනත

**21ඒ (1) වෙනි වගන්තිය යටතේ කරන නියෝගය**

කම්කරුවන් හා ජනසතු සේවාවන් පිළිබඳ අමාත්‍ය ධුරන්ධර මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, මට කලින් සිටි ඇමතිතුමකු විසින්, 1957තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පනතේ 20 (1) වෙනි වගන්තිය යටතේ කරන ලදින්, 1959 පෙබරවාරි 28 වෙනිදා 11.687 වෙනි අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ නියෝගය, මේ සමඟ ඇති උපලේඛනයෙහි දක්වා ඇති එක් එක් දේපලට සම්බන්ධ වන තරමින්, 1961කේ 22 වෙනි අංකය සහ 1962කේ 34 වෙනි අංකයත් දරණ පනත් වලින් සංශෝධිත 1957තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පනතේ 21ඒ (1) වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පිට මේ නියෝගයෙන්, 1963තේ අප්‍රියෙල් මස 1 වෙනිදා සිට, අවලංගු කරමි.

ඇම්. පී. ද ඉසැඩ්. සිරිවර්ධන,
කම්කරුවන් හා ජනසතු සේවාවන් පිළිබඳ අමාත්‍යතැන.

1963තේ මාර්තු මස 8 වෙනි දින,
කොළඹදී ය.

## උපලේඛනය

| දේපොළ | පිහිටීම හා සෙසු විස්තර |
| --- | --- |
| **1. සීමාසහිත නොදර්න් ඔම්නි බස්රථ සමාගම විසින් පාවිච්චි කරන ලද දේපොළ.** | |
| වශී ප්‍රමාණයෙන් අක්කර 1ක් පමණ වූ පෙරියපුලම් නැමති ඉඩම හා එහි ඇති සියළු ගොඩනැගිලි. | යාපනේ නාගරික සහා ප්‍රදේශ සීමාව තුල උතුරට : පොන්නු සෝන් ආසපිල්ලේ නැමති අයට අයිති ඉඩමය ; නැගෙනහිරට : පෞද්ගලික පටුමගය ; දකුණට : තයිල්මුත්තු කන් දයියා මහත්මියට අයිති ඉඩමය ; බස්නාහිරට : පේදුරු තුඩුවට යන මහ පාරය යන මේ මායිම් ඇතුලත පිහිටි යාපනයේ පේදුරු තුඩුව පාරේ 140 වෙනි වරිපනම් අංකය දරණ ස්ථානය. |
| **2. සීමාසහිත වලිගමම් වෙස්ට් බස්රථ සමාගම විසින් පාවිච්චි කරන ලද දේපළ.** | |
| ප්‍රමාණයෙන් රූඩ් 1ක් පමණවූ මාථකන් කුරුවිල් පුදුක්කාඩු නැමති ඉඩමෙන් කොටස හා එහි පිහිටි සියළු ගොඩනැගිලි. | යාපනය දිස්ත්‍රික්කයේ කිරී මලෙයි නැමති ගමේ උතුරට : එස්. විස්වනාදන් නෝනා මහත්මියගේ දේපළය ; නැගෙනහිරට : ගම්සභා පටු මගය ; දකුණට ප්‍රධාන පාරය ; බස්නාහිරට : මෙම ඉඩමේ ම ඉතිරි කොටසය යන මේ මායිම් ඇතුලත පිහිටා තිබේ. |

3-717/1

| දේපල | පිහිටීම හා සෙසු විස්තර |
| --- | --- |
| සවිර මඩුවක් හා "රැම්පයක්" පිහිටියාවූ ද ඊට අයිති වූද ගග අද්දර වත්ත නමින් ව්‍යවහාර වන්නාවූ ද, හැඳින්වෙන්නාවූ ද, පර්චස් 22ක් ප්‍රමාණයේ මුළු ඉඩම. | රත්නපුරයේ නගරසභා සීමාවන් තුල, උතුරට රිවර් සයිඩ් පාරේ 16 වෙනි වරිපනම් අංකය දරන ඉඩමය ; නැගෙනහිරට : රිවර් සයිඩ් පාරය ; දකුණට බෝමළුවය නගර සභා ඉඩම), බස්නාහිරට කළු ගඟය යන මේ මායිම් තුල පිහිටා තිබේ.<br>මෙය 793 වෙනි අංකය හා 1960 සැප්තැම්බර් මස 12 වෙනි දින දරන්නාවූද, බලය ලත් මිණින්දෝරු කෙනෙකු වන ඩී. ඩබ්ලිව්. ගුණරත්න මහතා විසින් සකස් කරන ලද්දාවූද මිනුම් සැලැස්මෙහි දක්වා ඇත.<br>(පැවරීමේ නියෝගය ප්‍රසිද්ධ වූයේ 1962කෙ ඔක්තෝබර මස 19 වැනි දින හා අංක 13,354 දරන ගැසට් පත්‍රයේ ය.) |
| **2. සීමාසහිත වලිගමම් වෙස්ට් බස්රථ සමාගම විසින් පාවිච්චි කරන ලද දේපල :** | |
| ප්‍රමාණයෙන් පර්චස් 20ක් පමණ වූ තෙරුන්චිප් පිඩ්ඩි නමැති ඉඩමේ කොටස සහ එහි පිහිටි සියළු ගොඩනැගිලි ඇතුළුව. | යාපනය දිස්ත්‍රික්කයේ කරයි නාගර් නම් ගමේ උතුරට, බස්නාහිරට සහ දකුණට එම ඉඩමේ ඉතුරු කොටස්ය, නැගෙනහිරට ප්‍රධාන පාරය, යන මේ මායිම් තුල පිහිටා තිබේ.<br>(පැවරීමේ නියෝගය ප්‍රසිද්ධ වූයේ 1960වේ අප්‍රේල් මස 29 වෙනි දින හා අංක 12,119 දරන ගැසට් පත්‍රයේ ය.) |

3-717/2

---

## 1957තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පනත

### 21 ඒ (1) වෙනි වගන්තිය යටතේ කරන නියෝගය

කම්කරුවන් හා ජනසතු සේවාවන් පිළිබඳ අමාත්‍ය ධූරන්ධර මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, මට කලින් සිටි ඇමතිතුමකු විසින් 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනා ගමන පනතේ 20 (1) වෙනි වගන්තිය යටතේ කරන ලදින්, 1960 වේ අප්‍රියෙල් මස 29 වෙනි දින 12,119 වෙනි ගැසට් පත්‍රයෙහි සහ 1962කේ ඔක්තෝබර මස 19 වෙනි දින 13,354 වෙනි ගැසට් පත්‍රයෙහි ද පලවූ නියෝගයන්, මේ සමග ඇති උපලේඛනයෙහි දක්වා ඇති එක එක් දේපලට සම්බන්ධවන තරමින්, 1961කේ 22 වෙනි අංකය සහ 1962කේ 34 වෙනි අංකයන් දරණ පණත්වලින් සංශෝධිත, 1957තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පනතේ 21ඒ (1) වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බල තල පිට මේ නියෝගයෙන්, 1963නේ අප්‍රියෙල් මස 1 වෙනිදා සිට අවලංගු කරමි.

ඇම්. පී. ද ඉසැඩ්. සිරිවර්ධන,
කම්කරුවන් හා ජනසතු සේවාවන් පිළිබඳ අමාත්‍යතැන.

1963නේ මාර්තු මස 8 වෙනි දින,
කොළඹදී ය.

## උපලේඛනය

| දේපල | පිහිටීම හා සෙසු විස්තර |
| --- | --- |
| **1. සීමාසහිත පානදුර මෝටර් ට්‍රාන්සිට් සමාගම විසින් පාවිච්චි කරන ලද දේපළ :** | |
| සවිර මඩුවක් සහ රැම්පයක් | ගොඩනැගිල්ල පිහිටා ඇත්තේ රත්නපුරේ ගඟ අද්දර වත්තේ ය.<br>(පැවරීමේ නියෝගය ප්‍රසිද්ධ වූයේ 1960වේ අප්‍රියෙල් මස 29 වෙනි දින හා අංක 12,119 දරණ ගැසට් පත්‍රයේ ය) |

---

ඇල් ඩී.-බී 11/48.

## පඩිපාලක සභා ආඥපනත

### නිවේදනයයි

(136 වෙනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥපනතේ 30 වන වගන්තියෙන් තමන්ට ලැබී ඇති බලය පිට මීට යාව ඇති උපලේඛනයෙහි සවිස්තරව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට කුරුඳු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව අදහස් කරන බව එකී පඩිපාලක සභා ආඥපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරුද්ධතාවයන් වෂී 1963 අප්‍රේල් මස 1 වන දින දවල් 12 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති මහතා විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන සෑම විරුද්ධතාවයක්ම එසේ විරුද්ධවීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිත ලියවිල්ලකින් විය යුතුය.

එන්. එල්. අබේවීර,
කුරුඳු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සභාපති.

1963 මාර්තු මස 8 වන දින,
කොළඹ දීය.

## උපලේඛනය

කුරුඳු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වෂී 1961 ජූනි මස 9 වැනි දින අංක 12,460 දරන ගැසට් පත්‍ර නිවේදනයෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ තීරණ එම උපලේඛනයේ II වන කොටස වෙනුවට පහත දැක්වෙන අභිනව කොටස යෙදීමෙන් වෙනස් කළ යුතුය.

### "II වන කොටස

#### කෑලි මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අඩුම වේතන ප්‍රමාණය

1. කුරුඳු තැලීමෙහි (පඳුරුවලින් කුරුඳු ගස් කැපීම, කෝටු කැපීම සහ තලන වාඩියට ගෙනයාම, පොත්තේ පිට සීවිය සීරීම, කෝටු තැලීම හෙවත් පොතු ගැලවීම, පොතු කුරුවලට හැර වීම හා කුරු ඇහිරීම සහ මිටි බැඳීම ඇතුළුවයි) යෙදී සිටින

කම්කරුවන්ට කැලි මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අඩුම වේතන ප්‍රමාණය තැලු කුරුඳු රාත්තලකට සත 80ක් විය යුතුය.

2. තුහුරු පැහීමෙහිදී යෙදී සිටින කම්කරුවන්ට කැලි මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අඩුම වේතන ප්‍රමාණය අක්කරයකට රුපියල් 15.00ක් විය යුතුය.

3. කාතු දැම්මෙහි යෙදී සිටින කම්කරුවන්ට කැලි මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අඩුම වේතන ප්‍රමාණය අඟල් 18ක් ගැඹුරු අඟල් 18ක් පළල කාණු දම්වැලකට රුපියල් 4.00ක් විය යුතුය.

4. අවුරුද්දකට වතාවක් පමණක් කෙරෙන වල් නෙලීමෙහි යෙදී සිටින කම්කරුවන්ට කැලි මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අඩුම වේතන ප්‍රමාණය අක්කරයකට රුපියල් 40.00ක් විය යුතුය."

3-736

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

### මහනුවර ආරෝග්‍යශාලා මණ්ඩලය

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පණතෙහි 11 වෙනි වගන්තිය යටතේ 1963 පෙබරවාරි මස 27 වෙනි දින පටන් 1963 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා බී. එච්. දුනුවිල මැතිණිය මහනුවර ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකාවක් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් පත් කරනු ලැබීය.

එල්. එස්. බී. පෙරේරා,
ස්ථිර ලේකම්.

1963 පෙබරවාරි මස 27 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

3-547

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

### කොළඹ ගණයට අයත් ආරෝග්‍යශාලා මණ්ඩලය

(219 වනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පණතෙහි 11 වෙනි වගන්තිය යටතේ 1963 පෙබරවාරි මස 12 වෙනි දින පටන් 1963 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා පහත සඳහන් අය කොළඹ ගණයට අයත් ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් පත්කරනු ලැබූහ.

එල්. එස්. බී. පෙරේරා,
ස්ථිර ලේකම්.

1963 පෙබරවාරි මස 12 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

නාම ලේඛනය

ආනන්ද ජයසිංහ මහතා

සී. එල්. වීරත්වල් මහතා.

3-558

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

### ගාලු ආරෝග්‍යශාලා මණ්ඩලය

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි 11 වෙනි වගන්තිය යටතේ 1963 පෙබරවාරි මස 22 වෙනි දින පටන් 1963 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා ජේ. එල්. පියසේන ද සිල්වා මහතා ගාලු ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබීය.

එල්. එස්. බී. පෙරේරා,
ස්ථිර ලේකම්.

1963 පෙබරවාරි මස 22 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

3-487

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මඟින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමතිතුමා.

1963 පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ 2.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මුදලි තුමාගේ ආදායම් පාලක කොට්ඨාශයේ අංක 541 දරණ ගල්කිස්ස ගම්මුලා දැනි වසමේ පිහිටි ගාලුපාරේ වරිපණම් අංක 370 දරණ කොම්පොස්සුගේ වත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති පර්චස් 25 ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට: වරිපනම් අංක 8 දරණ බී. ජේ. පෙරේරාට අයිති ඉඩම; නැගෙනහිරට: කොළඹ-ගාල්ල ප්‍රසිද්ධ පාර; දකුණට: වරිපණම් අංක 376 (ගාලුපාර); බස්නාහිරට: ඩබ්ලිව්. තෝමස් ප්‍රනාන්දුට අයිති ඉඩම සහ කේ. ජී. රණවීරට අයිති ඉඩම.

3-504

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මඟින් අත් කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමතිතුමා.

1963. 2. 19 වැනි දින දීය,
කොළඹ 2.

උප ලේඛනය

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ අංක 830 දරණ වඳුරම්බ ගම්මුලාදෑනි වසමේ පිහිටි සෙන්ට් මාක් වත්තට අයිති අළුබෝගහගොඩැල්ල නැමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 4ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට: මාටින් වත්ත; නැගෙනහිරට: මාටින් වත්ත; දකුණට: ප්‍රසිද්ධ පාර; බස්නාහිරට: මිල්ලගහ අස්වැද්දුම සහ වේරගල අස්වැද්දුම.

3-532

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මඟින් අත් කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමතිතුමා.

1963 පෙබරවාරි 19 වැනි දින,
කොළඹ 2.

උප ලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මුදලිතුමාගේ ආදායම් නිලධාරි කොට්ඨාශයේ තිඹිරිගස්යාය ගම්මුලාදැනි වසමේ පිහිටි බෝලමේසවත්ත නැමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අඩි 270ක් දිග. හා අඩි 5ක් පලලැති ඉඩම් කොටසක් :—

උතුරට: අංක 416 හා 416/1 යන ඉඩම්; නැගෙණහිරට: අංක 416/3 සිට 416/35 යන ඉඩම්; දකුණට: මු. සැ. ඒ. 4472 පෙන්වා ඇති ඉඩම; බස්නාහිරට: මු.සැ. ඒ 4472 පෙන්වා ඇති පවුමග.

3-529

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## දැන්වීමයි

වර්ෂ 1948 අප්‍රේල් 30 වැනි දින අංක 9,859 දරණ ගැසට්පත්‍රයෙහි පළවූ ව්‍යවස්ථාවෙන් සංශෝධිත පරිදි, ජාතික කෞතුකාගාර පණතේ (187 අධිකාරය) 9 වැනි වගන්තිය යටතේ පැණවුණු ව්‍යවස්ථාවන්හි 3 වැනි ව්‍යවස්ථාව අනුව කොළඹ, මහනුවර, යාපනය සහ රත්නපුර පිහිටා ඇති ජාතික කෞතුකාගාර 1963 ක්වූ අප්‍රියෙල් 14 වැනි දින හා මැයි 7 වැනි දින යෙදෙන ප්‍රසිද්ධ නිවාඩු දින නිමිත්තෙන් වසා තබන බැව් මෙයින් දන්වනු ලැබේ.

ප. දැරණියගල,
ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂක.

1963 මාර්තු 4 වැනි දින,
කොළඹ දී ය.

3-481

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

**ආයුර්වේද පණතේ 22 වැනි ඡේදයේ 1 වන උපච්ඡේදයේ "ඌ" වගන්තියේ යටත ආයුර්වේද විද්‍යාල හා ආරෝග්‍යශාලා මණ්ඩලයට උපාධිධාරීන් තෝරා පත්කර ගැනීමේ ඡන්දදායක ලැයිස්තුව**

1961 අංක 31 දරන ආයුර්වේද පණතේ 22 ඡේදයේ 1 වන උපච්ඡේදයේ "ඌ" වගන්තිය යටතේ තෝරා පත් කර ගනු ලබන අභිඥාන පත්‍ර ධාරීන් සඳහා ඡන්දය දීමට සුදුසුකම් ඇති, ස්වදේශීය වෛද්‍ය මණ්ඩලය විසින් නිදහනය කරනු ලැබූ හෝ ලියාපදිංචිය සඳහා පිළිගනු ලැබූ අභිඥාන පත්‍ර දරන්නන්ගේ අවධාරණය 1962 නොවැම්බර් 22 වන දින හා අංක 13,399 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද (ඒ ඒ මණ්ඩලවලට තෝරා පත් කර ගැනීමේ) ආයුර්වේද නියෝගවල 3 වන කොටසට මෙයින් යොමු කරනු ලැබේ.

මේ නියෝගවල 3 වන කොටසේ 1 වන ඡේදයේ "ආ" වගන්තිය අනුව පිළියෙළ කරන ලද ඡන්දදායක ලැයිස්තුව කොළඹ, කොටාරෝඩ්හි ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ පිහිටි රෙජිස්ට්‍රාර් තැනගේ කාර්යාලයේදී සාමාන්‍ය කාර්යාල වේලාවලදී ඡන්දදායකයන් විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා, 1963 මාර්තු 22 වන දින දක්වා විවෘතව ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඡන්දදායක ලැයිස්තුවේ සංශෝධනයන් සඳහා කරනු ලබන ලිඛිත ඉල්ලීම් 1963 මාර්තු 27 දින දවල් 12 වනතුරු පහත නම් සඳහන් මා විසින් භාර ගනු ලැබේ.

රෙජිස්ට්‍රාර්,
ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය.

1963 මාර්තු 9 දා,
කොළඹ 8.

3-669

---

## දැන්වීමයි

**කු/ශ්‍රී ආරියවංශ පිරිවෙන, දුනුපොත, බණ්ඩාරකොස්වත්ත**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දුනුපොත පිහිටි ඉහත සඳහන් පිරිවෙන රජයේ ආධාර ලබන පිරිවෙනක් ලෙස ලියාපදිංචි කිරීමට උඩගෙදර පඤ්ඤාකිත්ති ස්ථවිරයන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ.

මේ දැන්වීම ප්‍රසිද්ධ කළ දිනයේ සිට තිස් දවසක් ඇතුළත ඉල්ලීමට විරුද්ධතාවයක් ඇති නම් මා වෙත දැන්විය යුතුය.

ඇස්. ඇෆ්. ද සිල්වා,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

ඊ. එස්. බී. 25.
1963 ක්වූ මාර්තු මස 8 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

3-692

---

**1961 වෙළඳ සමාගම් (ගණන් පරීක්ෂක) රෙගුලාසි (අංක 7 අ. දරණ වගන්තියට අනුව) යටතේ 1962/63 කාල පරිච්ඡේදය සඳහා ලියාපදිංචි කරන ලද ගණන් පරීක්ෂකවරුන්ගේ ලැයිස්තුවයි**

**පුද්ගලයන් (සාමාන්‍ය සහතිකය)**

| නම | | ව්‍යාපාරික ලිපිනය |
|---|---|---|
| නමාසිවයම් අන්නමලෙයි | ... | 181 3/1, යුනියන් පෙදෙස, කොළඹ 2. |
| ෆිලික්ස් සිසිල් ජස්ටින් බොනිෆේස් අර්සකුලරත්න | ... | 4 වෙනි මහල, හේමාස් ගොඩනැගිල්ල, යෝක් වීදිය, කොළඹ 1 |
| රොනල්ඩ් ජේම්ස් බැරෝ | ... | ලොයිඩ්ස් ගොඩනැගිල්ල, කුමාර වීදිය, කොළඹ 1 |
| සිසිල් ජූලියන් බොක්ස් | ... | 135 1/3, වෙල්ල වීදිය, පිටකොටුව, කොළඹ |
| සරවනමුත්තු කුමාරස්වාමි | ... | 181 3/1, යුනියන් පෙදෙස, කොළඹ 2 |
| ඇන්තනි මර්වින් නොයෙල් ද කොස්තා | ... | 18 1/7, ඉන්දියා රාජ්‍ය බැංකු ගොඩනැගිල්ල, කොළඹ 1 |
| බෙන්තොටගේ රොබට් ද සිල්වා | ... | 370–372, ලංකා බැංකු ගොඩනැගිල්ල, කොළඹ 1 |
| සේද්‍රික් ට්‍රැවෝර් ද සිල්වා | ... | 29 1/8, ගෆූර් ගොඩනැගිල්ල, කොළඹ 1 |
| ජෝන් දිසින්ද්‍රාස් | ... | 32, ශ්‍රීමත් මොහොමඩ් මාකන් මාර්කර් මාවත, කොළඹ 3 |
| මලවිගේ තිස්සක ලාල් ප්‍රනාන්දු | ... | ටර්ක්වන්ඩ් යන්ග්ස් සහ සමාගම බාරේ, තැ. පෙ. 101, කොළඹ |
| වීදියගේ කොරනේලිස් ප්‍රනාන්දු | ... | 223, පංචිකාවත්ත පාර, මරදාන, කොළඹ 10 |
| මග්ගොනගේ ඩඩ්ලි යුසිරස් සෝමසිරි ප්‍රනාන්දු | ... | 250, ජී. ඕ. එච්. ගොඩනැගිල්ල, කොළඹ 1 |
| වෙන්කතසුබ්බයාර් ගනපති | ... | 173, සහ 175, දෙවැනි හරස් වීදිය, කොළඹ 11 |
| තෝමස් විල්කින්සන් හාඩ්ස්ටාෆ් | ... | වර්ක්වන්ඩ් යන්ග්ස් සහ සමාගම, තැ. පෙ. 101, කොළඹ 1 |
| අබ්දුල් රහිමන් මොහොමඩ් හනි | ... | 29 2/2, ගෆූර් ගොඩනැගිල්ල, කොළඹ 1 |
| උපතිස්ස හුලුගල්ල | ... | 29 2/11, ගෆූර් ගොඩනැගිල්ල, කොළඹ 1 |
| දෙන් සොලොමන් කහවිට | ... | 41, කැනැල් රෝඩ්, කොළඹ 1 |
| සභාපති පිල්ලෙයි කනේසලිංගම් | ... | 265, ගාලු පාර, කොළඹ 3 |
| අරුලම්පලම් කරුණාලිංගම් | ... | ෆෙපර්ඩ්, රෝඩ්ස්, තෝන්ටන් සහ සමාගම බාරේ, කොළඹ 1 |
| තායිල් පද්මනාභන් කේසවන් | ... | 78, කොන්සිස්ටරි ගොඩනැගිල්ල, කෙළින් වීදිය, කොළඹ 11 |
| අසෙන්කුඩ්ඩුස් අබ්දුල් ලතීෆ් | ... | 29 2/10, ගෆූර් ගොඩනැගිල්ල, කොළඹ 1 |
| අලවි ඉබ්‍රාහිම් මාකන් මාර්කාර් | ... | 32, ශ්‍රීමත් මාකන් මාකර් මාවත, කොළඹ 3 |
| මුත්තයියා මුනෝහරන් | ... | 43, ත්‍රිකුණාමල වීදිය, මහනුවර |
| දෙන් හෙන්රි පෙරේරා මුණවීර | ... | 250, දෙවැනි මාලය, ලංකා බැංකු (ජී. ඕ. එච්) ගොඩනැගිල්ල, කොළඹ 1 |
| මරුතප්පා නාගනාදන් | ... | හුලුගල්ල, සහ වික්‍රමනායක, ගෆූර් ගොඩනැගිල්ල, කොළඹ 1 |
| තර්මන් රාසයියා නවරත්නම් | ... | 32, ශ්‍රීමත් මොහමඩ් මාකන් මාකර් මාවත, කොළඹ 3 |
| කන්ඩියූර් නාරායන පනික්කාර් | ... | 25, සැන් සෙබස්තියන් කන්ද, කොළඹ 12 |
| මුතුකුමාරස්වාමි පසුපති | ... | 54, 3/1, ඕස්ට්‍රේලියා ගොඩනැගිල්ල, කොළඹ 1 |
| නවගමුවගේ කිංස්ලි ජෝන් ක්‍රිෂොස්ටම් පෙරේරා | ... | 4 වැනි මහල, හේමාස් ගොඩනැගිල්ල, යෝර්ක් වීදිය, කොළඹ 1 |
| ටෙරන්ස් එඩ්වින් | ... | 29 1/11, ගෆූර් ගොඩනැගිල්ල, කොළඹ 1 |
| හඳපාන්ගොඩගේ කර්නෝලිස් පීරිස් | ... | 29 2/9, ගෆූර් ගොඩනැගිල්ල, කොළඹ 1 |
| හෙන්රි ලේ පෝජ් | ... | ඕස්ට්‍රේලියා ගොඩනැගිල්ල, යෝර්ක් වීදිය, කොළඹ 1 |
| රාජසිංහම් පූපාලසිංහම් | ... | 29 2/9, ගෆූර් ගොඩනැගිල්ල, කොළඹ 1 |
| ෆ්‍රෙඩ්රික් හයසින්ත් පුවිමානසිංහ | ... | 18 1/7, ස්ටේට් බැංකු ගොඩනැගිල්ල, කොළඹ 1 |
| තුගේගොඩ ගබඩාගේ පබලිස් පණ්ඩිතරත්න | ... | ෆෙපර්ඩ්, රෝඩ්ස්, තෝන්ටන් සහ සමාගම, ලංකා ටෙම්පස් ගොඩනැගිල්ල, කොළඹ 1 |
| ඥානප්‍රගාසම් රාජදෙරෙයි | ... | 81 1/8, නාග ගොඩනැගිල්ල, කුමාර වීදිය, කොළඹ 11 |
| තාමෝදරම් පිල්ලෙයි රාජරත්නම් | ... | නාග ගොඩනැගිල්ල, 81 2/5, කුමාර වීදිය, පිටකොටුව, කොළඹ 11 |

| | නම | | ව්‍යාපාරික ලිපිනය |
|---|---|---|---|
| 38. | සින්නයියා රාමයියා | ... | 43, ත්‍රිකුණාමල වීදිය, මහනුවර |
| 39. | ධර්මරාජා රාමස්වාමි | ... | නීග්‍රිස් ගොඩනැගිල්ල, යෝර්ක් වීදිය, කොළඹ 1 |
| 40. | සිරිනිවාස රෙන්ගන් | ... | නීග්‍රිස් ගොඩනැගිල්ල, යෝර්ක් වීදිය, කොළඹ 1 |
| 41. | ජෝන් රොජර් | ... | 2 වැනි මාලය, යෝක් ගොඩනැගිල්ල |
| 42. | කුමාරස්වාමි සච්චිතානන්ද | ... | 54 3/1, ඔස්ට්‍රේලියා ගොඩනැගිල්ල, කොළඹ 1 |
| 43. | රාජරත්නම් තිරුඥාන සම්බන්දර් | ... | 181 3/1, යුනියන් පෙදෙස, කොළඹ 2 |
| 44. | දෙන් එඩ්වින් ආනෝල්ඩ් සේනාරත්න සමරවීර | ... | බී. ආර්. ද සිල්වා සහ සමාගම බාරේ, ලංකා බැංකු ගොඩනැගිල්ල, කොළඹ 1 |
| 45. | පොන්නුසාමි සතාසිවම් | ... | 181 3/1, යුනියන් පෙදෙස, කොළඹ 2 |
| 46. | සැමුවෙල් සවරිමුත්තු | ... | නාග ගොඩනැගිල්ල, 81, කුමාර වීදිය, කොළඹ 11 |
| 47. | වල්ලිපුරම් සින්නදෙරෙයි | ... | බූරා හති සහ සමාගම, ගෆූර් ගොඩනැගිල්ල, කොළඹ 1 |
| 48. | මහාදේව සුබ්‍රමානියම් | ... | 176, දෙවැනි හරස් වීදිය, කොළඹ 11 |
| 49. | ක්‍රිෂ්ණමූර්ති ස්වාමිනාදන් | ... | නීග්‍රිස් ගොඩනැගිල්ල, යෝර්ක් වීදිය, කොළඹ 1 |
| 50. | සිවරත්නම් වේලුපිල්ලයි | ... | ෆෝඩ්, රෝඩ්ස්, තෝන්ටන් සහ සමාගම, තැ: පෙ: 186, කොළඹ 1 |
| 51. | විශ්වනාදන් සොකලිංගම් | ... | 78, කෙලින් වීදිය, කොළඹ 11 |
| 52. | ඇන්තනි ජෝසප් ලෝරන්ස් විජේගුණවර්ධන | ... | සිසිල් අර්සකුළරත්න සහ සමාගම, හේමාස් ගොඩනැගිල්ල, කොළඹ 1 |
| 53. | ඇලස්ටන් ඩෝල්ටන් එඩ්වර්ඩ් ද සිල්වා විජේරත්න | ... | 54 3/1, ඔස්ට්‍රේලියා ගොඩනැගිල්ල, කොළඹ 1 |

ඩබ්ලිව්. ඇම්. සෙල්ලයියා,
සමාගම් රෙජිස්ට්‍රාර්.

1963 පෙබරවාරි මස 5 වැනි දින,
කොළඹ දී ය.

3—497/1

---

## 1961 වෙළඳ සමාගම් (ගණන් පරීක්ෂක) රෙගුලාසි (අංක 7 ආ. දරණ වගන්තියට අනුව) යටතේ 1962/63 කාලපරිච්ඡේදය සඳහා ලියාපදිංචි කරන ලද ගණන් පරීක්ෂකවරුන්ගේ ලැයිස්තුව

### සමාගම් (සාමාන්‍ය සහතිකය)

| | සමාගමේ නම | | හවුල්කරුවන්ගේ නම් | ව්‍යාපාරික ලිපිනය |
|---|---|---|---|---|
| 1. | ඒ. ඒ. ලතීෆ් සහ සමාගම | ... | අසෙන්කුඩ්ඩුස් අබ්දුල් ලතීෆ් ... | 29 2/10, ගෆූර් ගොඩනැගිල්ල, කොළඹ 1 |
| 2. | අයියාර් සහ සමාගම | ... | සිරිනිවාස රෙන්ගන්, ධර්මරාජා රාමස්වාමි සහ ක්‍රිෂ්ණමූර්ති ස්වාමිනාදන් ... | නිග්‍රිස් ගොඩනැගිල්ල, යෝර්ක් වීදිය, කොළඹ 1 |
| 3. | ඒ. අයි. මාකන් මාර්කර් සහ සමාගම | ... | අලව් ඉබ්‍රාහිම් මාකන් මර්කාර් ජෝන් ඩියන් දස් සහ කර්වන් රාසයියා නවරත්නම් ... | 32, ශ්‍රීමත් මොහොමඩ් මාකන් මර්කාර් මාවත, කොළඹ 3 |
| 4. | බී. ආර්. ද සිල්වා සහ සමාගම | ... | බෙන්තොටගේ රොබර් ද සිල්වා සහ දෙන් එඩ්වින්ආර්නෝල්ඩ් සේනාරත්න සමරවීර | 2 වැනි මාලය, ලංකා බැංකු ගොඩනැගිල්ල, කොළඹ 1 |
| 5. | බූරා හාති සහ සමාගම | ... | අබ්දුල් රහීමන් මොහොමඩ් හති සහ වල්ලිපුරම් සින්නදෙරෙයි | 29 2/2, ගෆූර් ගොඩනැගිල්ල, කොළඹ 1 |
| 6. | කාර්ටර් ද කෝස්තා සහ සමාගම | ... | ඇන්තනි මර්විල් නොයෙල් ද කෝස්තා සහ ෆ්‍රෙඩ්රික් හයසින්ක් පුව්මානසිංහ ... | 18 1/7, ස්ටේට් බැංකු ගොඩනැගිල්ල, කොළඹ 1 |
| 7. | සිසිල් අර්සකුලරත්න සහ සමාගම | ... | ෆිලික්ස් සිසිල් ජස්ටින් ෆේජ් අර්සකුලරත්න, නවගමුවගේ කිංස්ලි ජෝන් ක්‍රිෂොස්ටම් පෙරේරා සහ ඇන්තනි ජෝසප් ලෝරන්ස් පෙරේරා විජය ගුණවර්ධන | 4 වැනි මාලය, හේමාස් ගොඩනැගිල්ල, යෝර්ක් වීදිය, කොළඹ 1 |
| 8. | ඩී. එච්. ජී. මුණවීර සහ සමාගම | ... | දෙන් හෙන්රි පෙරේරා මුණවීර සහ මග්ගොනගේ ඩඩ්ලි යුසිරස් සෝමසිරි ... | 250, 2 වැනි මාලය, ලංකා බැංකු (ජී. ඕ. එච්) ගොඩනැගිල්ල |
| 9. | ෆොන්සේකා සහ සමාගම | ... | එඩ්වින් ෆ්‍රැන්සිස් එම්මානුවෙල් ෆොන්සේකා | 50, ජෙනරල්ස් ලේක් පාර, කොළඹ 2 |
| 10. | ෆෝඩ්, රෝඩ්ස්, තෝන්ටන් සහ සමාගම | ... | සිවරත්නම් වේලුපිල්ලෙයි, නුගේගොඩ ගබඩාගේ පබිලිස් පණ්ඩිතරත්න, අරුලම් පලම් කරුණාලිංගම් සහ ස්ටැන්ලි විලියම් පර්සිවල් | ලංකා ටෛම්ස් ගොඩනැගිල්ල, කොළඹ 1 |
| 11. | එච්. ටී. පීරිස් සහ සමාගම | ... | හඳපාන්ගොඩගේ ටර්නෝලිස් පීරිස් සහ රාජසිංහම් පූපාලසිංහම් | 29 2/9, ගෆූර් ගොඩනැගිල්ල, කොළඹ 1 |
| 12. | හුලුගල්ල සහ වික්‍රමනායක | ... | උපතිස්ස හුලුගල්ල සහ මරුකප්පා නාගනාදන් | 29 2/11, ගෆූර් ගොඩනැගිල්ල, කොළඹ 1 |
| 13. | ජේ. සිසිල් බොක්ස් සහ සමාගම | ... | ජූලියන් සිසිල් බොක්ස් ... | 135 1/3, චෙල්ල වීදිය, කොළඹ |
| 14. | ජෝන් රොජර් සහ සමාගම | ... | ජෝන් රොජර් ... | 2 වැනි මාලය, යෝර්ක් ගොඩනැගිල්ල, කොළඹ 1 |
| 15. | කේසවන් සහ සමාගම | ... | කාසිල් පද්මනාභන් කේසවන් ෂොකලිංගම් විශ්වනාදන් සහ මුත්තසියා මහේශරන් | 78, කෙලින්වීදිය, කොළඹ 11 |
| 16. | කනෝසලිංගම් සහ සමාගම | ... | සභාපති පිල්ලෙයි කනෝසලිංගම් ... | 265, ගාලු පාර, කොළඹ 3 |
| 17. | ලෝරි මුතුක්‍රිෂ්නා සහ සමාගම | ... | ඥනප්‍රගාසම් රාජදෙරෙයි ... | 81 1/8, නාග ගොඩනැගිල්ල, කුමාර වීදිය, කොළඹ 11 |
| 18. | ඇම්. ඇන්. සම්බමූර්ති සහ සමාගම | ... | සරවනමුත්තු කුමාරස්වාමි රාජරත්නම් තිරු ඥනසම්බන්දර, නමාසිවයම් අන්නමලෙයි සහ පොන්නුසාමි සතාසිවම් | 181 3/1, යුනියන් පෙදෙස, කොළඹ 2 |
| 19. | ඕ. ටී. ඩේවිඩ් සහ සමාගම | ... | අසෙන්කුඩුස් අබ්දුල් ලතීෆ් ... | 29 2/10, ගෆූර් ගොඩනැගිල්ල, කොළඹ 1 |
| 20. | පනික්කාර් සහ සමාගම | ... | කන්ඩියූර් නාරායන පනික්කාර් ... | 25, සැන්ට් සෙබස්තියන් කන්ද, කොළඹ 12 |
| 21. | පෝප් සහ සමාගම | ... | හෙන්රි ලේ පෝප් ... | ඔස්ට්‍රේලියා ගොඩනැගිල්ල, යෝර්ක් වීදිය, කොළඹ 1 |
| 22. | පී. ඇස්. සුබ්‍රමනියා අයියාර් සහ සමාගම | ... | මහාදේව සුබ්‍රමානියම් ... | 176, දෙවැනි හරස් වීදිය, කොළඹ 11 |

| සමාගමේ නම | හවුල්කරුවන්ගේ නම | ව්‍යාපාරික ලිපිනය |
|---|---|---|
| 23. රාමයියා සහ සමාගම ... | සින්නයියා රාමයියා සහ මුත්තයියා මනෝහරන් | 43, ත්‍රිකුණාමල වීදිය, මහනුවර |
| 24. සච්චිතානන්ද, ෂොක්මන්, විජේරත්න සහ සමාගම ... | කුමාරස්වාමි සච්චිතානන්ද, ඇලෙස්ටර් ඩෝල්ටන් එඩ්වර්ඩ් ද සිල්වා විජේරත්න සහ මුතුකුමාරස්වාමි පසුපති | 54 3/1, ඔස්ට්‍රේලියා ගොඩනැගිල්ල, කොළඹ |
| 25. එස්. සවරිමුත්තු සහ සමාගම ... | සැමුවෙල් සවරිමුත්තු ... | නාග ගොඩනැ ගිල්ල, කුමාර වීදිය, කොළඹ 11 |
| 26. ටෙරන්ස් පෙරේරා සහ සමාගම ... | ටෙරන්ස් එඩ්වින් පෙරේරා ... | 29 1/11, ගෆූර් ගොඩනැගිල්ල, කොළඹ 1 |
| 27. ට්‍රියුඩර් වී. පෙරේරා සහ සමාගම ... | සෙඩ්රික් ට්‍රෙවෝර් ද සිල්වා ... | 29 1/8, ගෆූර් ගොඩනැගිල්ල, කොළඹ 1 |
| 28. ටර්ක්වන්ඩ්, යන්ග්ස් සහ සමාගම ... | තෝමස් විලිකින්සින් හා ඩිස්ටාව්. රොනල්ඩ් ජේම්ස් බැරෝව්, මලවගේ තිස්සක ලාල් ප්‍රනාන්දු සහ ඩේවිඩ් විලියම් රොබට්සන් | ලොයිඩ් ගොඩනැගිල්ල, කුමාර වීදිය, කොළඹ 1 |
| 29. ඩබ්ලිව්. සී. ප්‍රනාන්දු සහ සමාගම ... | වීදියගේ කොරනේලිස් ප්‍රනාන්දු ... | 223, පංචිකාවත්ත පාර, මරදාන, කොළඹ 10 |
| 30. විජේරත්න සහ සමාගම ... | ක්ලැමන්ට් බලෙයිස් විජේරත්න, මයිකල් ජෝන් ඇලස් ජෝන් යූස්ටස් ඩන්ග්ස්ටන් මාර්ටින් සහ ආවාන් ලූවිස්ත් බෙන්ජමින් බ්‍රිටෝ මුතුනායගම් | 70 1/1, වැකැම් වීදිය, කොළඹ 1 |

ඩබ්ලිව්. ඇම්. සෙල්ලයියා,
සමාගම් රෙජිස්ට්‍රාර්.

1963 පෙබරවාරි මස 5 වැනි දින,
කොළඹ දී ය.

3—479/2

## ප්‍රකාශනයයි

ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ මොනරාගල ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ ගවයින් අතර "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරණායක වන මම, 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥාපනතේ 470 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි:—

උතුරට: මොණරාගල දිස්ත්‍රික්කයේ මැදගම්පත්තු කෝරළයේ හා තිකවැරටිය කෝරළේ මඩකලපු දිස්ත්‍රික්කයේ යටිනුවර කෝරළේ; දකුණට: මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල කෝරළේ; නැගෙනහිරට: අම්පාර දිස්ත්‍රික්කයේ පරණ පත්තු; බස්නාහිරට: මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල කෝරළයේ බදුල්ල දිස්ත්‍රික්කයේ කුඹල්වැලි කෝරළේ සහ පස්සර කෝරළේ.

2. මෙම ආඥාපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනා ලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරින් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීතිරීති සම්බන්ධව වැඩි විස්තර බණ්ඩාරවෙල පශු වෛද්‍ය තැනගෙන් හෝ මොණරාගල කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කාර්‍යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතුයි.

අබේරත්න බණ්ඩාරණායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරිතැන.

1963 මාර්තු මස 6 වැනි දින,
පේරාදෙණියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරිගේ කාර්‍යාලයේ දී ය.

3-657/1

## ප්‍රකාශනයයි

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ හපුතලේ කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ බණ්ඩාරවෙල නගරයේ ගවයින් අතර "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම, 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥාපනතේ 470 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි:—

උතුරට: උඩකිඳ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ දඹවිනි පළාත කෝරළේ; දකුණට: වැල්ලවාය ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ කෝන්ගල බින්තැන්න සහ වැල්ලවාය; නැගෙනහිරට: යටිකිඳ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ කුඹල්වෙල කෝරළේ; බස්නාහිරට: කඩවත සහ මැද ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ තල්පිටිගම් පත්තුව.

2. මෙම ආඥාපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනා ලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරින් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීතිරීති සම්බන්ධව වැඩි විස්තර බණ්ඩාරවෙල පශු වෛද්‍ය තැනගෙන් හෝ හපුතලේ කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කාර්‍යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතුයි.

අබේරත්න බණ්ඩාරණායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරිතැන.

1963 මාර්තු මස 8 වැනි දින,
පේරාදෙණියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරිගේ කාර්‍යාලයේ දී ය.

3-657/2

## කුර සහ මුඛ රෝගය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ නැගෙනහිර ගිරුවාපත්තුවේ නැටොල්පිටිය, උස්වැව සහ අබේසේකරගම යන ගම්මුලාදෑනි කොට්ඨාශවල ගවයින් අතර "කුර සහ මුඛ රෝගය" නැමැති ගව වසංගත රෝගය පැතිරයන හෙයින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ වැඩබලන ආණ්ඩුවේ ඒජන්ත තැන්පත් සංගරපිල්ලේ කදිර්කාමනාතන් වන මා විසින් බෝවෙන රෝග සම්බන්ධ ආඥාපනතේ 327 වෙනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වෙනි උප වගන්තිය යටතේ පහත සඳහන් සීමාව තුළ පිහිටි ප්‍රදේශය බෝවෙන ගවරෝග ග්‍රස්ථ ප්‍රදේශයක් ලෙස සලකනු ලබන බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

උතුරට: රත්නපුර දිස්ත්‍රික්කයේ මායිම;
දකුණට: මුහුද;
නැගෙනහිරට: හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාගම්පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ මායිම;
බටහිරට: හම්බන්තොට දිස්ත්‍රික්කයේ බටහිර ගිරුවාපත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ මායිම;

2. මෙම ආඥාපනතේ 7වැනි වගන්තියේ ප්‍රකාර තහනම් කරනලද ඉහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයින් හෝ ගවයින් බඳිනලද වාහන මෙම දැන්වීම අවලංගු කැරෙන තෙක් ගෙනයාම තහනම් කරමි.

## ප්‍රකාශනයයි

නෑගෙනහිර පළාතේ අම්පාරේ දිස්ත්‍රික්කයේ වැවගම් පත්තුව කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ ගවයින් අතර "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම, 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥපනතේ 470 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අනුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි:—

උතුරට: මඩකලපු දිස්ත්‍රික්කයේ මායිම; දකුණට: හල්ඔය, සංවර්ධන මණ්ඩලයට අයත් ප්‍රදේශයේ මායිම; නැගෙනහිරට: කල්මුනෙයි සහ අක්කරෙයිපත්තු ආදායම් පාලක නිලධාරි කොට්ඨාශ මායිම; බස්නාහිරට: මොණරාගල දිස්ත්‍රික්කයේ සහ බින්තැන්න පත්තුවේ මායිම්.

2. මෙම ආඥපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනා ලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්තකරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීතිරීති සම්බන්ධව වැඩි විස්තර උගත පශු වෛද්‍ය තැනගෙන් හෝ වැවගම් පත්තුව කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කායසීලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතුයි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි.

1963 මාර්තු 8 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරිගේ කායසීලයේදී ය.

3-694

---

## රෝගීන්ගේ අයිතිවාසිකම් නොකියන ලද මුදල් වාර්තාවයි

| රෝහලේ නම | රෝගියාගේ නම | මැරුණු දිනය | අයිතිවාසිකම් නොකියන ලද මුදල |
|---|---|---|---|
| රජයේරෝහල, වැලිගම | කනංකේ පදිංචි ඩී. දියෝනිස් | 60. 1. 7 | රු. 4.66 |

ඉහත සඳහන් අයිතිවාසිකම් නොකියන ලද මුදල් වැලිගම රජයේ රෝහලට ඇතුල් කරනු ලබා සිටි රෝගියාට අයත් ය. ගැසට් පත්‍රයේ පලවී සුමාන තුනකට ප්‍රථම ඒවාට අයිතිවාසිකම් ඉදිරිපත් නුවුවහොත් එම මුදල රෝහල් ආදයම වෙනුවෙන් තැන්පත් කරමි.

පී. ආඬවරමූර්ති,
මාතර සෞඛ්‍ය සේවා අධිකාරි වෙනුවට.

1963 පෙබරවාරි 28 වැනි ද,
මාතර සෞඛ්‍ය සේවා අධිකාරි කායසීලයේ දීය.

3-540

---

## ලංකා දුම්රිය සේවය

**දුම්රිය මාගීය /හරහා මහා මාගීය වැටී ඇති ස්ථාන අළුත්වැඩියා කිරීම**

ප්‍රධාන මාර්ගයේ හැ. 111 දම්. 01 දරණ නුම්රවිලිය හැඹන් සාරේ හැ. 86 ද. 03 පු. 10 අසල දුම්රිය මාර්ගය හරහා මහාමාර්ගය වැටී ඇති ස්ථානය අළුත්වැඩියා කිරීම ලබන මාර්තුමස 15 වෙනි සිකුරාදා පෙරවරු 7.00 සිට පස්වරු 4.00 දක්වාත් නැවත පසුදින සෙනසුරාදා පෙරවරු 7.00 සිට ඉරිදා පස්වරු 4.00 දක්වාත් කරනු ලැබේ.

මෙම මාර්ගය 15 වෙනි සිකුරාදා පෙරවරු 7.00 සිට පස්වරු 4.00 දක්වාත් 16 වෙනි සෙනසුරාදා පෙරවරු 7.00 සිට පස්වරු 9.30 දක්වාත් නැවත 17 වෙනි ඉරිදා පෙරවරු 1.30 සිට පස්වරු 4.00 දක්වාත් අඩක් වසා ප්‍රවේශමෙන් රථවාහන ගමනාගමනයට ඉඩදෙනු ලැබේ.

16 වෙනි සෙනසුරාදා පස්වරු 9.30 සිට 17 වෙනි ඉරිදා පෙරවරු 1.30 දක්වා රථවාහන ගමනාගමනයට සම්පූර්ණයෙන් වසා තබනු ඇත.

දුම්රිය සාමාන්‍යාධිකාරී.

3-482

---

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.**

ලංකාවේ වැලවත්තයෙහි පිහිටි "වීස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණයිතනි